**වවුනියා උතුර ප්‍රාදේශීය සභාව**
**වවුනියා දිස්ත්‍රික්කය**

-----------------------------------------

**1.** මූල්‍ය ප්‍රකාශන

---------------------------

**1.1** මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-----------------------------------------------

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 පෙබරවාරි 28 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 30 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 සැප්තැම්බර් 30 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2** **තත්ත්වාගණනය කළ මතය**

-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට වවුනියා උතුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---------------------------------------------

**1.3.1** **ගිණුම්කරණ අඩුපාඩු**

---------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ එකතුව රු.219,544 ක් වූ ණය ශේෂයන් වර්ෂය අවසානයේ සේවක ණය ශේෂයට ඇතුළත් කර නොතිබූ බැවින්, සේවක ණය ශේෂය අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සභාවට ලැබිය යුතු රු.1,724,164 ක් වූ මුද්දර ගාස්තු, ආදායම් ණයගැති ගිණුමට ඇතුළත් කර නොතිබූ බැවින්, සභාවේ ජංගම වත්කම් අඩුවෙන් දක්වා තිබුණි.

**1.3.2** **විගණනය සඳහා සාක්ෂි නොමැති වීම**

------------------------------------------

විගණනයට අවශ්‍ය තොරතුරු සහ සාක්ෂි ඉදිරිපත් නොකිරීම හේතුවෙන් රු.1,815,647 ක් වටිනා ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

**1.3.3** **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

---------------------------------------------------

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා රීති (මූල්‍ය සහ පරිපාලන) | |
| (i) රීති 217 | සභාව විසින් ප්‍රයෝජනයට ගන්නා ලද සියලු ඉඩම් සහ ගොඩනැගිලි සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ii) | රීති 165 | වගකීම්, ආදායම හා වියදම ප්‍රධාන ලෙජරයේ වාර්තා කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 571 | ඉකුත් තැන්පතු එකතුව රු.1,150,532 ක් දිගු කාලයක සිට තැන්පතු ගිණුමේ තබා තිබුණද මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය. |
| (ඇ) | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 – 1 ඡේදය | සෑම මාස හයකට වරක්ම වාහනවල ඉන්ධන ටැංකිය සම්පූර්ණයෙන්ම පුරවා වාහනය ධාවනයේ යොදවා ඉන්ධන පරිභෝජනය පරීක්ෂා කළ යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

-------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ මෙහෙයුම්වලින් පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම් අතිරික්තය රු.7,201,813 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම් අතිරික්තය රු.7,232,745 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රතිඵලයේ රු.30,932 ක වර්ධනයක් දැක්වුණි.

### 2.2 අසම්භාව්‍ය බැරකම්

----------------------

නයිනමඩු කරප්පුකුත්ති මාර්ගයේ ගල් ඇතිරීම හා තාර දැමීම සඳහා ප්‍රදානය කර තිබූ ප්‍රාථමික කොන්ත්‍රාත්තුවක් අවලංගු කර තිබුණි. එබැවින්, මේ සම්බන්ධයෙන් අධිකරණයේ නඩුවක් ගොනු කර තිබූ අතර 2013 සිට 2016 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ නෛතික ගාස්තු සඳහා රු.593,808 ක මුදලක් වැයකර තිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල මෙය අසම්භාව්‍ය බැරකමක් ලෙස දක්වා නොතිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය

------------------------

#### 2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

--------------------------------------

අයවැය ඇස්තමේන්තු විධිමත්ව පිළියෙල කර නොතිබූ හෙයින් හා ඇස්තමේන්තු සැලසුම් කිරීම හා වැඩසටහන්ගත කිරීම විධිමත්ව සිදුකර නොතිබීම හේතුවෙන් අයවැයගත ආදායම් සහ තථ්‍ය ආදායම් අතර විචලනයක් විගණනයේදී නිරීක්ෂණය විය.

#### 2.3.2 දේපල සඳහා වරිපනම් බදු

------------------------------

සභාවේ විෂය පථය යටතේ වන දේපල පිළිබඳ ප්‍රත්‍යාගණනයක් පසුගිය වර්ෂ 10 කට වැඩි කාලයක් සිදුකර නොතිබූ අතර ඒ සඳහා වරිපනම් බදු ආදායම අයකර නොතිබුණි.

**2.3.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

---------------------------------

**(අ) උසාවි දඩ මුදල්**

--------------------

විවිධ ආඥා පනත් යටතේ වවුනියා අධිකරණයෙන් 2016 දෙසැම්බර් 31 දිනට සභාවට ලැබිය යුතු රු.94,910 ක් වූ උසාවි දඩ මුදල් අයකර ගැනීමට සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**(ආ) මුද්දර ගාස්තු**

-----------------

2011 වර්ෂයේ සිට 2015 දක්වා කාලපරිච්ඡේදය සඳහා සභාවට ලැබිය යුතු 1,724,164 ක් වූ මුද්දර ගාස්තු ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.4 කළමනාකරණ අකාර්යක්ෂමතා**

----------------------------------------

(අ) සභාවේ මෝටර් වාහන 04 ක් පැවති නමුත් එම වාහනවල අයිතිය සභාවට පවරා ගැනීම සඳහා කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවල ඌනතාවයන් ලෙස භාණ්ඩ වර්ග 25 ක් දක්වා තිබුණි. කෙසේ වුවද, මේ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**2.5 වත්කම් කළමනාකරණය**

-----------------------------------

උතුරු පළාතේ වැඩි දියුණු කරන ලද යළි පිබිදෙන ව්‍යාපෘතිය යටතේ ඉදිකර නැදුන්කරනි ප්‍රාදේශීය සභාවට 2011 අගෝස්තු 12 දින භාරදෙන ලද රු.26,137,591 ක් වටිනා බස් නැවතුම්පොළ උපයෝජනය කිරීම සඳහා කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

**3. පද්ධති හා පාලන**

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(i) ආදායම් රැස් කිරීම්
(ii) ස්ථාවර වත්කම්
(iii) අත්තිකාරම් ලැබීම්
(iv) අත්තිකාරම් ගෙවීම්
(v) ප්‍රාග්ධන කාර්යයන්
(vi) ප්‍රධාන ලෙජරය පවත්වා ගැනීම